# පුරාතන යුගයේ මානව සන්නිවේදන විධි පිළිබඳ විග්‍රහයක්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය
**අජිත් තල්වත්ත**

මානව සමාජය ආරම්භ වූ දා සිට මිනිසා එකිනෙකා අතර අදහස් හා සිතිවිලි හුවමාරු කරගන්නා ලදී. දෛනික ජීවිතය තුළ අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධතා පැවැත්වීමේ දී අනුග මනය කළ සන්නිවේදනය ඉතා වැදගත් වේ.[1] එදා සිට අද දක්වා මානව සන්වේදනයේ විවිධ ක්‍රමවේදයන් ඔස්සේ සිදු කරන අතර මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ පුරාතනයේ මිනිසා ස්වකීය සන්නිවේදන කටයුතු සිදු කළ අයුරු හඳුනාගැනිම සඳහා ය.

ඉංග්‍රීසි භාෂාවෙන් කොමියුනිකේෂන් යන වචනයයි සිංහලෙන් "සන්නිවේදනය" ලෙස භාවිත වන්නේ Munis යන ලතින් බසින් බිඳී ආ communis ලෙස විකාශනය වී communicar වශයෙන් සංවර්ධනය වී communication යන්න හැදුණු බවට බොහෝ දෙනාගේ පිළිගැනීම වේ.[2] ඉතා පුළුල් විෂයක් තුළ භාවිත වන "සන්නිවේදනය" යන්නෙහි අර්ථය විමසා බැලීම ඉතා වැදගත් ය. "ඔක්ස්පර්ඩ්" ශබ්දකෝෂයට අනුව " භාෂණය, ලේඛනය, හෝ සංඥා මගින් අදහස්, දැනුම ඉදිරිපත් කිරීම හෝ හුවමාරුව සන්නිවේදනය ලෙස දක්වා ඇත. කොලොම්බියා විශ්වකෝෂය සන්නිවේදනය ලෙස පෙන්වන්නේ අදහස්, පණිවිඩ, ශබ්ද හා සංඥා ඇසුරු කොට සංක්‍රමණය වීම යනුවෙනි. තවද සන්නිවේදනය පිළිබඳ ව පවතින විද්වත් මත කිහිපයක් අවබෝධ කර ගත යුතුය. චාල්ස් කුලීගේ මතය වන්නේ මානව සම්බන්ධතා රඳා සිටින්නාවූත්, වර්ධනය කරන්නාවූත් සියලු සංකේත මෙන්ම, ඒවා දේශයෙන් දේශයට ප්‍රවාහනය කිරිමටත්, කාලයේ

බැඳුම්වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කර ගැනීමටත් උපකාරී වන්නේ සන්නිවේදනය යි. කිසියම් පුද්ගලයකු තවත් පුද්ගලයකු කෙරෙහි ඔවුන් දෙදෙනා අතර පවත්නා මාධ්‍ය මගින් ඉදිරිපත් කළ හැකි විවිධ සංඥා හසුරුවාලීමෙන් බලපෑමක් ඇති කළ විට සංනිවේදනය පැන නගින බවට චාල්ස් ඊ. ඔස්ගුඩ් අදහස් කරයි.[3] මෙම නිර්වචනයන් තුළින් සන්නිවේදනය යන්නෙහි අර්ථය හඳුනා ගැනීමට හැකි ය.

දඩයම් කිරීමෙන් ස්වකීය ජීවන වෘත්තිය ආරම්භ කළ මානවයා ක්‍රමිකව තම අවශ්‍යතා සපුරා ගැනීමට සමත් විය. පරිසර පද්ධතිය මිනිස් අවශ්‍යතා සපුරාලීමේ ප්‍රධාන ඒකකය බවට පත්වීම ඉතා වැදගත් අවස්ථාවකි. ප්‍රාථමික මානවයා තම අදහස් එකිනෙක අතර හුවමාරු කිරීමේ දී ප්‍රධාන ක්‍රමවේදයන් තුනක් යටතේ සිදුකර ඇත.[4] එනම්,

ශබ්ද සන්නිවේදන
සංඥා සන්නිවේදන
සලකුණු සන්නිවේදන යනුවෙනි.

ප්‍රාථමික මානවයා තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා විවිධ ශබ්ද භාවිත කළ බව පෙනේ. එදා සිට අද දක්වා ම එවැනි ක්‍රමවේදයන් අනුගමනය කිරීම කරනු ලබයි. ඇතැම් බොහෝ අංග වියැකී ඇතත් 'හූව' භාවිත කිරීමත් පවතී. විවිධ අදහස් හැඟවීම පිණිස හූ ශබ්දය භාවිත කළ අතර එමගින් මිනිසුන් කැඳවීම, අනතුරු ඇඟවීම හා උදව් ලබාගැනීම සිදු කළ බව පෙනේ.[5] මෙම පරමාර්ථයන් සපුරා ගැනීමේ දී හූ ශබ්දයෙහි යම් යම් වෙනස්කම් පවතින්නට ඇත. ප්‍රාථමික මානවයාගේ හූව අද දක්වා ම ව්‍යවහාරයේ පවතී. නමුත් අද නගන හූ ශබ්දයේ එදාමෙන් අදහස් ප්‍රකාශ කිරීමේ ශෛලිගත ක්‍රමයක් නොමැත. හූව වැඩි වශයෙන් භාවිත වන්නේ ගම්බදව ය.

මිනිසා දඩයම් යුගයේ ඉක්මවා ගොවි යුගයට පිවිසීමෙන් පසු ද හූව අමතක කර නැත. හේනේ පැලට හෝ කුඹුරේ පැලට හෝ යාමට සූදානම් වී ගමරාළ සෙසු අයට ද දැන්වීම පිණිස හූව යොදාගෙන ඇත. පැරණි ගැමියා ගොවිතැන් කළේ අත්තම් ක්‍රමය

යටතේය.[6] සමූහිකව එකට වැඩ කළ පිරිස් සී සැම හෝ කුඹුර කෙටීම නියමකාරයෙන් දිනය දැනුම් දී ඇත්තේ හූවක් පවසා ය.

භාෂාව පහළ වීමට පෙර හැඟීම් ප්‍රකාශ වූයේ විවිධ සංඥා ක්‍රම භාවිත කිරීමෙනි. පුරාතන මානවයා වචන භාවිතයෙන් පසු අදහස් පැවසීම පිණිස උපයෝගි කරගත් බොහෝ සංඥා අභාවයට ගිය බවට සැකයක් නැත. එහෙත් ඔවුන් විසින් භාවිත කරන ලද සංඥාවලින් කිහිපයක් අදත් භාවිතයේ පවති. එනම් අත වැනීම්, අත්පුඩි ගැසීම, හිස වැනීම, රැවීම, ඉඟි කිරීම, සිප ගැනීම සහ ගැස්සීම යන ඒවා අන්තර්ගත වේ.

ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා විසින් භාවිත කරන ලද ශබ්ද සංඥා ක්‍රමය ද ඉතා වැදගත් වේ. තමා ජීවත් වන පරිසර පද්ධතිය තුළ වෙසෙමින් යම් යම් ශබ්ද හා සංඥාවන්ට අනුගත වීමක් දක්නට ඇත. ඒ මගින් තම වර්ගයාට අදහස් ප්‍රකාශ කිරීමටත්, අවශ්‍ය දෑ ඉටුකර ගැනීමටත් මැනවින් හැකි විය. වනාන්තරගතව සිටි මිනිසා ගින්දර සොයාගැනීම සමඟ ගින්න මගින් ඇති කරගත් දුම් තුළින් වනාන්තරයට මැදිව සිටි වර්ගයා අතර සීමිත අදහස් ප්‍රකාශ කළෝය. දෘශ්‍ය සංඥා ලෙස හඳුන්වන මෙම ප්‍රාථමික මාධ්‍ය අතු කඩා එල්ලීම, ගස්වල සලකුණු තැබීම, තණ පඳුරු එකට අල්ලා බැඳීම යනාදී සලකුණු ඉතා වැදගත් විය.

ප්‍රාථමික මානවයා ගින්දර සොයාගැනීම ඔහු විසින් දියුණුවට දමන ලද අත්තිවාරම සේ සැලකිය හැකි ය. මිනිස් ජීවිතයේ බොහෝ කාර්යයන් සඳහා ගින්නෙන් ලැබුණු සහය ඉතා වැදගත් විය. ප්‍රාග් ඓතිහාසික අවධියේ සංඥා සන්නිවේදන මාධ්‍ය පරිණාම වීමට බලපෑ සාධකයන් ද එම පරිසරය විසින්ම ඇති කළ සීමා බලපාන ලදී. ජනගහනය වර්ධනය වී මිනිසා පරිණාමයට පත්වීමත් සමඟ තම සංනිවේදන ක්‍රමයන්හි විශාල ප්‍රගතියක් අත්කරගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මානවයා සංකේත වෙත යොමු වූ බව පෙනේ.

මානව අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී බාහිර සමාජය වෙත තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා සංකේත රාශියක් භාවිත කළ බවට පැහැදිලි ය. දැනට හඳුනාගෙන ඇති තොරතුරුවලට

අනුව මුල් මිනිසා විසින් රූප සංකේත රාශියක් භාවිත කළ බව පෙනේ. ගල් ලෙන් ඇසුරෙ මිනිසාගේ දෛනික ජීවිතයේ කටයුතු වඩාත් හොඳින් හා පහසුවෙන් ඉටුකර ගැනීමට හැකි විය. තමා ලද අත්දැකීම් සිතුවම් මගින් පවා බාහිර සමාජයට පෙන්වීමට හැකි වූ බව පෙනේ.[7] ප්‍රධාන වශයෙන් ක්‍රි.පූ. 30000 - 10000 අතර වකවානුවක ඇඳි චිත්‍ර ප්‍රංශයේ ලැස්කෙර ග්‍රාමෙහි සහ ස්පාඤ්ඤයේ ඇල්ටමීරා ගුහාවල සටහන් වී ඇත. එහි දූන්න, බයිසන් ගවයා, මුවා හා ඌරන් ආදි සතුන්ගේ රූප දක්නට ලැබේ. රේඛාවලින් ඇඳි මෙම සත්ව රූපවලින් සතුන්ගේ ඉරියව් ද පිළිබිඹු කරේ. තම අදහස් ප්‍රකාශ කිරීමට චිත්‍රය උපයෝගි කරගත් බව මෙමගින් තහවුරු වේ.[8] විශේෂයෙන් ම ලංකාවේ දී මුල් මානවයා විසින් අඳින ලද විවිධ සිතුවම් තන්තිරිමලේ, පිල්ලේගොඩ ආදි ස්ථාන තුළ දක්නට ඇත.[9] මෙම සිතුවම් පිළිබඳ ව අදහස් දක්වන වියතුන් පවසන්නේ එවකට මිනිසාගේ ආගමික චාරිත්‍ර නිරූපණය වීම හෝ ගෝත්‍රික වත්පිළිවෙත් හෝ ඝන සීතල සමයේ හුදකලා මිනිසාගේ හුදු නිර්මාණ බවයි.

ගොවි යුගය ආරම්භයත් සමඟ මිනිසා ශිෂ්ටත්වයට පත් වූ බව මානව විද්‍යාඥයින්ගේ අදහස වේ. මිනිසා කැළයේ ජීවත් වූ අවධියේ අදහස් ප්‍රකාශ කිරීම පිණිස භාවිත කළ ශබ්ද හා සංඥා වෙනුවට අදහස් ප්‍රකාශ කිරීමට වචන භාවිතය යම් අවධියක ඇති වී එදා සිට මිනිසාගේ ශිෂ්ටාචාරයේ ආරම්භය ඇති වූ බවට සමාජ විද්‍යාඥයන්ගේ මතය වේ.[10] ශබ්ද හා සංඥා භාවිතය අත්හළ මිනිසා වචන භාවිතයට පෙළඹුණේ ය. ගංගා ඇසුරෙන් තම ජනපද ආරම්භ කර භූමිය පිළිබඳ අයිතිවාසිකම් කීමට පටන් ගත්තේ ය. මිනිසා ශිෂ්ටත්වයට පත්වීමෙන් පසු බොහෝ සංනිවේදන විධි සමාජයට එක් විය.

ප්‍රාථමික මානවයා ක්‍රමික ලෙස දියුණුවට පත්වීමෙන් පසු අක්ෂර භාවිතයට හුරු විය. ක්‍රි.පු. විසිවන සියවසේ දී පමණ ලිඛිත අක්ෂර භාවිතයට යොමු වී ඇත. මුල්ම අක්ෂර සහිත ශිලා ලේඛන සිලබරි ලෙස හඳුනාගෙන තිබේ. ඉන් අනතුරුව ග්‍රීක අක්ෂර සෙමිටික් ලේඛන භාවිතයට ලක්විය. විවිධ ස්ථාන ඇසුරෙන් ලේඛන කලාව පිළිබඳ ව තොරතුරු ලැබුණ ද සාර්ථක ලේඛන ක්‍රමයක් මුලින්ම හදාගෙන ඇත්තේ සුමේරියන්වරු ය.

අපරදිග ශිෂ්ටාචාරයේ දී එබඳු තත්ත්වයේ ලිඛිත සන්නිවේදන ක්‍රමයක් ප්‍රචලිත වු බව පෙනේ. ඊට සාපේක්ෂව පෙරදිග ලෝකයේ ලිඛිත සන්නිවේදනය ආරම්භ වන්නේ චීනය ඇසුරෙනි. චීනය ඇසුරෙන් බොහෝ දේ පිළිබඳ ව ආභාසය ලැබූ ජපානය ක්‍රි.පූ. 5 වන සියවස වන විට ලිඛිත සන්නිවේදන ක්‍රම මගින් අදහස් ප්‍රකාශ කර ඇත.

පෙරදිග ලේඛන සන්නිවේදනය පිළිබඳ විමසීමේ දී මොහෙන්දජාරෝ හරප්පා ශිෂ්ටාචාරය ඇසුරෙන් මැටි පුවරු මත අක්ෂර ලිවීමේ සම්ප්‍රදායන් ආරම්භ විය. කුමන අරමුණක් පාදක කරගෙන මෙකී අක්ෂර රචනා කළා ද යන්න පැහැදිලි නොමැති වුවත් එමගින් යම් සන්නිවේදනයක් වූ බව පැහැදිලි ය. මෙම පසුබිමෙන් අනතුරු ව ඉන්දියාවේ දැකගත හැකි අක්ෂර මාලාවක් ලෙස බ්‍රාග්මී අක්ෂර සඳහන් කළ හැකි ය. ඉන්දියාවට සිදු වූ ආර්යාගමනයෙන් පසු බ්‍රාහ්මී අක්ෂර මාලාව තව තවත් වැඩි දියුණුවට පත් විය. ක්‍රි.පූ. තුන්වන සියවසට පෙර සිට ද මේ මෙම අක්ෂර මාලාව ලංකා සමාජයට බලපෑවේ ය. මෙරටින් ද පූර්ව බ්‍රාග්මී ශිලා ලිපි රැසක් හමු වී තිබේ. මෙරට පැවැති කිනම් තත්ත්වයක වුව ද වූ අක්ෂර මාලාව හා ලේඛන කලාව ඉතා දියුණු පසුබිමකට පත් වුයේ මහින්දාගමනය හා බුදු සමය සමග භාරතීය සමකාලින ලේඛන ක්‍රමයන් ද පැමිණියේ ය. ඉන්දු - ආර්ය භාෂා මූලයන්ගෙන් ප්‍රභවයලත් මෙරට ලිඛිත සන්නිවේදනය ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. දහවන සියවස දක්වා කාලය තුළ ඉතා දියුණු තත්ත්වයකට පත් වූ බව එවක බිහි කළ සෙල්ලිපි සාක්ෂි දරයි.[11] සෙල්ලිපි පමණක් නොව ලිඛිත ග්‍රන්ථ රචනය ද ආරම්භ වේ. නිදසුන් ලෙස මහාවංසය, දීපවංසය, යනාදිය පෙන්වා දිය හැකි ය.

පුරාණ මිනිසා ශිෂ්ටත්වයට පත්වීමෙන් අනුව යොදාගත් ශබ්ද සන්නිවේදනයෙහි වෙනස්කම් රාශියක් ඇති විය. එම සන්නිවේදන ක්‍රම අතර අණ බෙරය, සන්ටාව, සොකඩය, ගෙඩිය ගැසීම, හක්ගෙඩිය පිඹීම, යනාදිය නිදසුන් වේ. මෙම සන්නිවේදනය ඉතා ප්‍රබල වූ අතර ජනතාවට අවශ්‍ය පණිවිඩය හොඳින් ලබාගැනීමට ද හැකි විය.

අණ බෙරය ගැසීම තවත් පැරණි සන්නිවේදන ක්‍රමයකි. රජුගේ අණ රට පුරා ප්‍රසිද්ධ කළේ අණ බෙරය මගිනි.[12] ආඥාව පළ කෙරෙන බෙර හඬ යන්න එහි කෙටි අරුත වේ.[13] මෙම භේරී වාදන අවස්ථාව ලක්දිව රාජධානි සමයෙහි පමණක් වාදනය කරන ලදි. රාජ ආඥාව අනුව බදු අය කර ගැනීම, නීති රීති පැනවීම, ආදි අවස්ථා රට වැසියනට දන්වා සිටිනු ලැබුවේ භේරී වාදනය මගිනි. මෙම තූර්ය වාදන අවස්ථාව වාදනය කරනු ලැබුවේ එක් භේරී වාදකයෙකු විසින් වන අතර ඒ සඳහා ලෝකඩවලින් සාදන ලද පටහ බෙරය සහ දවුල හා සමාන භාණ්ඩයක් යොදා ගෙන ඇත.

පුරාතන ලංකාවේ අණ බෙර වැයූ බවට සෙල් ලිපිවලින් අනාවරණය වේ.[14] දුටුගැමුණු රජතුමා විසින් අණ කරන ලදුව අණ බෙර ලැබූ අන්දම ථූපවංසයේ සඳහන් වේ. " සෙට දගබ බඳනා තන්හි මහා සංඝයා වහන්සේ රැස් වන සේක්වා'යි දන්වා අනුරාධපුරයට වැද නුවර බෙර ලන්නෝ"[15]..... සිංහල බෝධිවංසයේ ද රජ අණ අනුව බෙර ලැවූ අන්දම 'රාජ සමුහයාගේ වචනය අසා නුවර බෙර හසුරුවා" යන ප්‍රකාශයෙන් පැහැදිලි වේ.[16] මහනුවර රාජධානි සමයේ දී පවා භේරි වාදකයින් සිටි බව පෙනේ. යුධ අවස්ථාවන් සඳහා භේරි වාදනය කිරීම ද අනිවාර්ය කටයුත්තකි. සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද සිරිතක් වශයෙන් ද විවිධ වර්ගයේ අවනද්ධ, ඝන හා සුෂිර වන ත්‍රි විධ වාද්‍ය භාණ්ඩ වාදනය කිරීම පැරණි අවධියේ යුද්ධ අවස්ථා තුළ ඉටුකරන ලද චාරිත්‍රයකි. සටන් බෙර, ජය බෙර, රණ බෙර, වාද බෙර, සහ මළ බෙර යනාදිය වාදනය කිරීමෙන් ජනතාවට අවශ්‍ය සන්නිවේදනය ලබාදීමට හැකි විය. මහනුවර යුගයේ ඇතැම් විහාරයන් සඳහා ඉඩම් ප්‍රදානය කිරීමේ දී බෙර වාදනය කර ඇත. නිදසුනක් ලෙස දඹුලු විහාරයට කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඉඩම් ලබාදීමේ දී ලෝකඩ තම්මැට්ටම ගසා ඇත.

ගෙඩිය ගැසීම ද පැරණි සන්නිවේදන ක්‍රමයකි. පුරාතනයේ සිට අද දක්වා මෙම ක්‍රමය ක්‍රියාත්මක වේ.[17] විහාරස්ථානවල හෝ ආරණ්‍ය සේනාසනවල පවතින උප සංස්කෘතියේ භාෂාවට අයත් වචනයකි ගෙඩිය ගැසීම. ගෙඩිය යනු අඟල් 8 ක් පමණ වූ අඩි දෙකක් පමණ වූ ඇතුළත සිදුර සහිත ලී කොටයකි. එයට

අතක් පමණ මහත ලී කැබැල්ලකින් ගැසීම ගෙඩිය ගැසීම ලෙස ව්‍යවහාර කෙරේ. භික්ෂූන් වහන්සේලාට උදය පිබිදීමට, මිදුල සහ සක්මන් මළු ඇමදීමට, විහාරයේ වතාවතට යාමට, පිණ්ඩපාතයේ වැඩීමට, දාන ශාලාවලට රැස්වීමට, භාවනා කිරීම ආදී විවිධ කාර්යයන් සඳහා වේලාව දැන්වූයේ ගෙඩිය ගැසීමෙනි. අස්ගිරි මහා වාහර මහා පිරිවෙනේ සිසුන්ගේ දෛනික දින චරියාවන් පවත්වාගෙන යාමේ දී අදට ද ගෙඩිය ගැසීම සිදු කරයි. ගෙඩිය ගැසීමෙන් ඒ ඒ වේලාවට නියමිත කාර්යන් හි යෙදීමට අණ දීමක් හෝ දැන්වීමක් කළේය. එනිසා ගෙඩියේ ශබ්දය ද සන්නිවේදන මාධ්‍යයක් බවට පත් විය.

සණ්ටාරය ද පැරණි සන්නිවේදන මාධ්‍යයකි. මිනිසාට සමීප වූ බොහෝ ඈතට ශ්‍රවණය කළ හැකි ස්වාභාවික දෝංකාරය වූ කලී මේඝ ගර්ජනය යි. ඇතැම් විට එය මූලාශ්‍රය කොට සණ්ටාව නිර්මාණය වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. බැබිලෝනියාවෙන් සොයාගත් වසර 3000 ක් පමණ පැරණි වූ සණ්ටාව දැනට සොයාගෙන ඇති ඉපැරණි ම සණ්ටාව වේ.[18] එහි හැඩය කැලණිය රජමහා විහාරයේ සණ්ටා ස්ථම්භයේ එල්ලා ඇති ජපන් හා චීන සණ්ටා සම්ප්‍රදායට බෙහෙවින් අනුකූල වූවකි. ඈත පුරාණයේ තයිතාලමක ස්වරූපයෙන් පැවති ප්‍රාථමික සණ්ටාව ද අද දක්වා වර්ධනය වූ බව ඇතැම් විද්වතුන්ගේ මතය වේ.

විවිධ හැඩයන්ගෙන් සමන්විත වූ සණ්ටාව ශ්‍රී ලාංකික අපට වඩාත් හුරු පුරුදු වූවකි. ක්‍රි.පූ. 3 වන සියවසේ ගොඩනංවන ලද චෛත්‍ය වූ ථූපාරාමයේ හැඩය ද සන්ඨා බව ප්‍රකට කරුණකි.[19] එම නිසා මෙම සුවිශේෂී හැඩය වාස්තු ශිල්පයට පවා පිවිසීමෙන් මෙම ලාක්ෂණික හැඩයේ වූ පෞරාණිකත්වය වඩාත් ස්ඵුට වේ. පන්සලේ, පල්ලියේ හෝ දේවාලයේ යන ස්ථානවල පූජාවන් තබන වේලාව සහ දේව මෙහෙය පවත්වන වේලාවන් දැන්වීම පිණිස සණ්ටාව ගසනු ලැබේ. පන්සලේ පූජාවට සණ්ටාරය ගැසුව ද එය සන්නිවේදනයක් නොවේ. එය ශබ්ද පූජාවකි. අතීතයේ දී රජවාසල අසල ද යුක්තිය ඉෂ්ට කිරීම ඉල්ලීම පිණිස සණ්ටාවක් එල්ලා තිබුණු බව එළාර රජු හා සම්බන්ධ කථා පුවතින් පැහැදිලි වේ. පන්සලට හෝ ගමට යම් කරදරයක් වී නම් සණ්ටාරය නොනවත්වා ම ගසනු ලැබේ. තවත් විටක ගමේ

ප්‍රශ්නයකට මිනිසුන් එකතු කරනු ලැබුවේ සණ්ටාරය මගින් නගන ශබ්ද තුළිනි. එබැවින් මිනිසුන් අතර සන්නිවේදනය කිරීම සඳහා යොදාගත් මාධ්‍යයන් ලෙස සණ්ටාරය ඉතා වැදගත් වේ.

සක් පිඹීම ද පැරණි සන්නිවේදන ක්‍රමයකි. පුරාණයේ සිට අද දක්වාම විවිධ ආගමික කටයුතුවල දී මෙන්ම සුබ කාර්යයන්වල දී සක් පිඹීම දක්නට ඇත. යුද්ධ සිදු කිරීමේ දී ජය සංඛ නාද පැවැත්වීමත් සිදු කරයි. ඇතැම් ප්‍රදානයන් ලබා දීමේ දී සක් පිඹීම කළ බවට සාක්ෂි හමු වේ. ඇඹිලිපිටියේ පිහිටි සංඛපාල විහාරයට ඉඩම් ලබාදීමේ දී සක් ගෙඩිය පිඹීමෙන් ශබ්දය ඇසෙනතාක් දුරට අයිති ඉඩම් අයිතිව ඇති බවට විහාරාධිපති හිමියන් පවසයි. දැනට මෙම විහාරයට ඉඩම් අක්කර 12500 ක් පමණ අයිතිව තිබේ.[20] මහනුවර යුගයේ දී විහාර හෝ දේවාල සඳහා ඉඩම් ලබාදීමේ දී මෙම චාරිත්‍රය ඉටු කර ඇත. මේ අනුව පැහැදිලි වන්නේ සක් පිඹීම ද ඉපැරණි සන්නිවේදන ක්‍රමයක් බව ය.

ඈත අතීතයේ අත්සන් භාවිතයට පෙර සිට පවා නොයෙකුත් දීමනාවක් ලබාදීමේ දී කට වචනය සන්නිවේදන ක්‍රමයක් ලෙස යොදාගෙන ඇත. නමුත් පරම්පරා ගණනාවක් යනතුරු එකී කට වචනයෙන් ලබා දුන් දෑ ඒ ආකාරයෙන් පැවති බව පෙනේ. ඉංග්‍රීසි පාලනය ආරම්භ වීමෙන් පසු මෙකී කට වචනයන් ලබාදුන් ඉඩම් වැනි දේ 1840 මුඩුබිම් පනත යටතේ රජයට පවරාගනී.[21] කෙසේ නමුත් කට වචනය ද පැරණි සන්නිවේදන ක්‍රමයකි.

සන්නස් මගින් යම් යම් ප්‍රදානයන් ලබාදුන් අවස්ථා ගණනාවක් පිළිබඳ තොරතුරු හමු වේ. මෙය ද ජනතාවට යමක් පැවසූ සන්නිවේදන ක්‍රමයකි. ක්‍රි.ව. පළමුවන සියවසේ අනුරාධපුර පාලනය කළ වසභ රාජ්‍ය සමයේ ඉසිගිරි ඇමතිවරයා යාපනය ප්‍රදේශය පාලනය කළ බවට වල්ලිපුරම් රන් සන්නස සාක්ෂි දරයි. තවද පළමුවන විජයබාහු රජතුමාට උපකාර කළ බුදල්නාවන්ට ගම්වරයක් ලබාදීම පිළිබඳ තොරතුරු පනාකඩුව තඹ සන්නස සාක්ෂි ලෙස ගත හැකි ය.[22] ඒවාගේ ම රජරට ශිෂ්ටාචාරය බිඳවැටී සිංහල රාජධානි නිරිතදිගට විතැන්වීමෙන් පසු බොහෝ ප්‍රදානයන් පිළිබඳ තොරතුරු ඇතුළත් සන්නස් රැසක් හමු වේ. මහනුවර බෞද්ධ පුනර්ජීවනයේ ඉතා වැදගත් කාල පරිච්ඡේදයක් සනිටුහන් කළ කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ බොහෝ විහාරයන්ට නොයෙක්

ප්‍රධාන සිදුකර තිබේ. ගංගාරාමය, ලංකාතිලකය, දෙගල්දොරුව, බඹරගල, මැදවල, සූරියගොඩ යනාදී විහාර උදෙසා ලබාදුන් ඉඩම් පිළිබඳ තොරතුරු සන්නස්වල සඳහන්ව ඇත.[23] මෙම සන්නස් ද ඉපැරණි සන්නිවේදන ක්‍රමයකි. රජතුමාගේ අවසරයෙන් අධිකාරම්වරුන් විසින් දෙන ලද දීමනා තුඩපත් නමින් හැඳින්වේ. තුඩපත් බොහොමයක් දීමනා පිළිබඳ ලියැවුණු ඒවා ය. ඒවා බොහෝ විට පුස්කොළ පොත්වල ලියා තිබේ.

අතපැන් වත්කිරීම තුළින් ද යම් සන්නිවේදනයක් සිදු වූ බවට පෙනේ. වර්තමානයේ ද යම් අයෙකු මියගිය විට, විවාහ චාරිත්‍ර ඇසුරෙන් ද පැන් වැඩීමක් සිදු කරයි. එහෙත් අතපැන් වත්කර යම් යම් ප්‍රදානයන් සිදු කළ අවස්ථා ඇත. රාජ කකුද භාණ්ඩ අතර ද පැන් කෙණ්ඩියක් අන්තර්ගත වේ. දේවානම් පියතිස් රජතුමා මහමෙවුනා උයන සඟ සතු කර පූජා කර ඇත්තේ අත පැන් වත් කිරීමෙනි. ඇතැම් විහාරස්ථාන උදෙසා ද ඉඩම් ලබාදීම සිදු කළේ අතපැන් වත්කිරිමෙනි.

විවිධ අරමුණු පාදක කරගනිමින් යම් පක්ෂියෙකු හෝ සත්ත්වයකු අත යවන ලද ලියමන, පණිවුඩය සන්දේශ ලෙස හඳුන්වයි.[24] සන්දේශ කාව්‍යයෙහි ආරම්භය දැකිය හැක්කේ සංස්කෘත සාහිත්‍යයෙහි ය. භාරත සංස්කෘතියෙහි ස්වර්ණමය කාලපරිච්ඡේදයක් වූ ගුප්ත යුගයේ දෙවන චන්ද්‍රගුප්ත රජුන් දවස විසූ කාලිදාසයන්ගේ 'මේඝ දූතය' ආදිතම සන්දේශය වශයෙන් සැලකේ.[25] තවද මහා භාරතයෙහි නල හා දමයන්තිගේ කථා පුවත දැක්වෙන නලෝපඛ්‍යානයෙහි නල කුමරු දමයන්ති කුමරිය හංසයන් අත. පණිවුඩ හුවමාරු කරගත් අයුරු විස්තර වේ.[26] වාල්මිකිගේ රාමායනයෙහි රාම සීත දෙදෙනා අතර පණිවුඩ ගෙන යාමට හනුමා නම් වඳුරෙක් යවන අතර රාවණා රජ විසින් ඔවුනොවුන් වෙන් කරනු ලැබූ නිසා රාම සීතා දෙදෙනා සිත් තැවුලෙන් පසු වෙයි. ඔවුන්ගේ සිත් තැවුල තුනී කොට ඔවුන්ගේ පණිවුඩ ගෙන ගියේ හනුමා නම් වඳුරු නායකයා යි.[27] මෙය ද සන්නිවේදන ක්‍රමයකි.

මෙරට ඉතිහාසයේ ද යොදාගනු ලබන සන්දේශ කාව්‍ය පිළිබඳ තොරතුරු ලැබේ. පළමුවන සිංහල සන්දේශ කාව්‍ය ලෙස සලකනු ලබන්නේ දැනට අවිද්‍යමාන මයූර සන්දේශය යි.[28]

තවත් පිරිසක් පවසන්නේ තිසර සංදේශය බවයි. කෙසේ නමුත් මෙරට සන්දේශ කාව්‍යවල ආරම්භය සනිටුහන් වන්නේ ගම්පොළ යුගයේ දී ය. ගම්පොළ යුගයෙන් පසු මෙරට ඉතිහසයේ සන්දේශ කාව්‍යවල ස්වර්ණමය යුගය උදා වන්නේ කෝට්ටේ යුගයෙනි. පරෙවි, කෝකිල, සැලළිහිණි, ගිරා, හංස වැනි සන්දේශ රචනා වන බව පෙනේ. කෝට්ටේ යුගයට සීමා නොවී මහනුවර යුගයේ දී සන්දේශ රචනා වේ. එකී සියලු සන්දේශ මගින් ජනතාවට යම් සන්නිවේදනයක් ලබාදීම කැපී පෙනේ.

ඈත අතීතයේ සිට ම මිනිසා දෛනික ජීවිතයේ දී විවිධ වූ උත්සව රාශියක් පවත්වා ඇත. ඒ සියල්ල මංගල, අවමංගල හා ආගමික උත්සව වශයෙන් වර්ග කළ හැකි ය. මෙම උත්සව පාදක කරගනිමින් යොදාගත් වර්ණය අනුව සන්නිවේදනය ද වෙනස් විය. ශෝකය සඳහා එල්ලූ වර්ණය සුදු ය. රජ කෙනෙක් තමා මළා යැයි බිසවට හැඟවූයේ සුදු කොඩිය ඔසවා ය. සිංහ කොඩිය හා බෞද්ධ කොඩිය වැදගත් ජාතික ආගමික අවස්ථාවල් යොදා ගනියි. රතුපාට භයානක පාටක් විය. මරන්න ගෙනියන මිනිසාගේ කරවට පැලඳ වූයේ රතුමල් මාලා ය. ජාතක කතා ඇසුරෙන් ද මරණයට කැපවූවන් රතු මල්මාලා පළදා යැවූ බවට දීඝිති කෝසල ජාතකය සාක්ෂි දරයි.

අප මෙතෙක් අවධානයට ලක්කළ කරුණු දෙස බැලීමේ දී පැහැදිලි වන්නේ මිනිස් ශිෂ්ටාචාරය ආරම්භ වූ දා පටන් ම මිනිසා ස්වකීය සන්නිවේදන කටයුතු සිදු කරන ලදී. ප්‍රාථමික සමාජයට අනුගත වෙමින් තම අවශ්‍යතා සපුරා ගැනීමට සමත් විය. එනමුත් ක්‍රමික ලෙස මෙම සමාජය ක්‍රමය දියුණුවට පත් වී ප්‍රසාරණය වීමත් සමඟ පුද්ගල ක්‍රියාකාරිත්වයේ ද විශාල දියුණුවක් හට ගත්තේ ය. එකිනෙකා අතර විවිධ අදහස් හුවමාරු කරගැනිම පිණිස යොදාගත් සන්නිවේදන ක්‍රම ඉහත සාකච්ඡා කළ කරුණුවලින් අවබෝධ වේ. ප්‍රාථමික මෙවලම් භාවිත කර ක්‍රමිකව දියුණු සන්නිවේදන ක්‍රම භාවිත කරමින් සංකීර්ණ වූ සමාජ ක්‍රමයක් වර්තමානයේ නිර්මාණය වී ඇත. නූතන සමාජ රාමුව තුළ මානව සන්නිවේදනය වඩාත් හොඳින් ප්‍රචලිත වී ඇති බැවින් විශ්වයේ තොරතුරු අනබලක් බවට පත් ව තිබේ.

## ආන්තික සටහන්


1. පියදාස, රෝහණ, ලක්ෂ්මන්, සන්නිවේදන විමර්ශන මාධ්‍ය හා සංවර්ධන පිළිබඳ කේන්ද්‍රය. 1998, පිටු. 02.
2. අත්තනායක, බන්දුල, සන්නිවේදන අධ්‍යයන කෙන්ද්‍රය, මිනුවන්ගොඩ, 1992, පිටු 01.
3. එම. පිටු. 02.
4. ගමගේ, නිමල්, ගැමි සන්නිවේදන, විමසුම මුද්‍රණාලය, මාතර, 1998, පිටු. 10.
5. එම, පිටු. 12.
6. ගමගේ, නිමල්, ගැමි සන්නිවේදන, විමසුම මුද්‍රණාලය, මාතර, 1998, පිටු. 16.
7. අත්තනායක, බන්දුල, ජනමාධ්‍ය ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථාන, සරස්වති ප්‍රකාශන, දිවුලපිටිය, 2000. පිටු. 10.
8. එම, පිටු. 12.
9. සෝමතිලක, එම්. පුරාණ ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2004, පිටු 1-20.
10. රත්නපාල, නන්දසේන, සමාජ විද්‍යාව හා මානව විද්‍යාව, ආරිය ප්‍රකාශකයෝ, වරාපොල, 2007, පිටු. 15.
11. අමරවංශ, කොත්මලේ, ලක්දිව සෙල්ලිපි, ගුණසේන සහ සමාගම, කොළඹ, 1969. පිටු. 12 - 14.
12. රත්නපාල, නන්දසේන, සමාජ විද්‍යාව හා මානව විද්‍යාව, පිටු. 153.
13. රාජපක්ෂ, වෛද්‍යවතී, බෞද්ධ පුද පූජා සහ භේරී වාදන සංස්කෘතිය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2002, පිටු. 54.
14. අමරවංශ, කොත්මලේ, ලක්දිව සෙල්ලිපි, පිටු. 26,
15. සිංහල ථූපවංසය, සංස්කරණය, කේ.ජී.ප්‍රේමරතන සහ රත්නසිරි අරංගල, ප්‍රදිප ප්‍රකාශගේ, කොළඹ, 1987, පිටු. 59.
16. සිංහල බෝධි වංශය, පිටු. 37.
17. කරුණානායක, නන්දන, සන්නිවේදනය ප්‍රභවය හා ව්‍යාජනිය, මාධ්‍ය ප්‍රකාශකයෝ නුගේගොඩ, 1994, පිටු. 05.
18. ජයකොඩි, ඒ.එල්.පී. 'සණ්ටාව' සිංහල විශ්වකෝෂය, සංස්. ටී.බී. කරුණාරත්න 10 වැනි කාණ්ඩය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1970, පිටු. 251.

19. සිරිවීර, ඉන්ද්‍රකීර්ති, රජරට ශිෂ්ටාචාරය හා නිරිතදිග රාජධානි, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ පිටු. 360-380.

20. සංඛපාල රජමහා විහාරයේ විහාරාධිපති හිමියන් සමඟ 2014/06/14 දින සාකච්ඡාය ඇසුරෙන් ලබාගත් තොරතුරු.

21. විමලරත්න, කේ.ඩී.ජේ.බ්‍රිතාන්‍යය යටතේ ශ්‍රී ලංකාවේ විහාර ඉඩම් පාලනය, කොළඹ, 1991, පිටු. 48.

22. සිරිවීර, ඉන්ද්‍රකීර්ති, රජරට ශිෂ්ටාචාරය සහ නිරිත දිග රාජධානි, පිටු. 95.

23. හොල්ට්, ජෝන් කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආගමික ලෝකය, පරි උදය ප්‍රසන්න මැද්දේගම, ප්‍රදීප ප්‍රකාශන, කොළඹ, 2002, පිටු. 274.

24. සන්නස්ගල, පුංචිබණ්ඩාර, සිංහල සන්දේශ සාහිත්‍ය, ලේක්හවුස්, කොළඹ, 1962, පිටු. 01.

25. හංස සන්දේශය සංස්, වික්‍රමසිංහ, කේ.ඩී.පී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1995, පිටු. 08

26. මහා භාරතය, සංස්, හිරිපිටියේ පඤ්ඤාතිස්ස, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1964, පිටු. 10.

27. රාමායනය, පරි. රණසිංහ සමන් චන්ද්‍ර, කතෘ ප්‍රකාශන, 2000, පිටු. 7- 14.

28. සේනානායක, පී.එස්.බී.සිංහල භාෂාව හා සාහිත්‍ය, එස් ගොඩගේ හා සහෝදරයෝ, 162.